ඉන්දියානු මහ කොමසාරිස් කාර්යාලය

කොළඹ

***

පුවත්පත් නිවේදනය

ශ්‍රී ලංකා ගුවන් හමුදාවේ 70 වන සංවත්සරයට සහභාගී වීම සඳහා ඉන්දීය ගුවන් හමුදාව පැමිණේ

ශ්‍රී ලංකා ගුවන් හමුදාව 2021 මාර්තු 2 වන දින සිය 70 වන සංවත්සරය සමරන අතර ශ්‍රී ලංකා ගුවන් හමුදාවේ අංක 5 ප්‍රහාරක බලගනය සහ අංක 6 හෙලිකොප්ටර් බලගනය වෙත ජනාධිපති වර්ණ පිරිනැමීම ද සිදු කෙරේ. මෙම ඓතිහාසික අවස්ථාව සැමරීම සඳහා ශ්‍රී ලංකාවේ ප්‍රථම වතාවට විශාල පරිමාණයේ ගුවන් සංදර්ශනයක් 2021 මාර්තු 03-05 දක්වා ගාලු මුවදොර පිටියේදී පැවැත්වීමට කටයුතු යොදා ඇත.

එකමුතු බව පෙන්වමින් සහ දෙරට සහ දෙරටෙහි හමුදාවන් අතර වසර ගණනක සිට පවතින සමීප අන්තර් ක්‍රියාවන් සහ සහෝදරත්වය විදහා දක්වමින් ඉන්දීය ගුවන් හමුදාව සහ ඉන්දීය නාවික හමුදාව සාරංග් (Advance Light Helicopter), සූර්ය කිරන් (Hawks), Tejas Fighter Aircraft, Tejas Trainer සහ Dornier Maritime Patrol Aircraft යන ගුවන් යානා විසින් පවත්වනු ලබන ගුවන් සංදර්ශනයක් සමඟින් මෙම අවස්ථාවට සහභාගී වනු ඇත. ඉන්දීය ගුවන් හමුදාවේ සහ ඉන්දීය නාවික හමුදාවේ ගුවන්යානා 23ක් මෙම අභිමානවත් අවස්ථාවට සහභාගී වනු ඇත.

ගුවන් සංදර්ශනය සඳහා සහභාගී වන ගුවන්යානා ඉන්දීය ගුවන් හමුදාවේ C17 Globe Master සහ C130J ප්‍රවාහන ගුවන් යානා හි සහයෙන් 2021 පෙබරවාරි 27 වන දින කොළඹට ළඟා විය.

ඉන්දීය ගුවන් හමුදාවේ සහ නාවික හමුදාවේ එවන් පුළුල් පරාසයක ගුවන් යානා සහ හෙලිකොප්ටර් ශ්‍රී ලංකාවට පිටත් කර එවීම තුළින් ඉන්දීය ගුවන් සහ නාවික හමුදාවන් සහ ශ්‍රී ලංකා ගුවන් සහ නාවික හමුදාවන් අතර පවතින සමීප මිත්‍රත්වය සංකේතවත් කරයි.

මෙම සංදර්ශනයට සහභාගී වන සියලුම ඉන්දීය ගුවන් යානා ඉන්දියාවේ නිෂ්පාදනය කර ඇති අතර එතුළින් පිළිඹිබු කෙරෙන්නේ ඉන්දියාවේ පර්යේෂණ සහ සංවර්ධන ක්ෂේත්‍රයේ දේශීය තාක්ෂණික දියුණුව සහ ඉන්දියාවේ ආරක්ෂක ක්ෂේත්‍රයේ නිෂ්පාදනයන්හි විශ්වාසවන්තභාවයයි. පළමු වරට ප්‍රදර්ශනය කෙරෙන Tejas Trainer ගුවන් යානය අදාළ සෞඛ්‍ය මාර්ගෝපදේශයන් දැඩිව අනුගමනය කරමින් ශ්‍රී ලංකා ගුවන් හමුදා නියමුවන් හට ඉන්දීය ගුවන් නියමුවන් සමඟින් ස්වාධීන ආරක්ෂක ප්‍රහාරයන්ටද අවස්ථාව සලසා දෙනු ඇත.

මෙම වැඩසටහනෙහිදී ශ්‍රී ලංකා ගුවන් හමුදාවේ සහ නාවික හමුදාවේ නිලධාරීන් හට ඉන්දීය නාවික හමුදාවේ සමුද්‍රීය මුර සංචාර ඩෝනියර් ගුවන් යානාවේ සංචාරය කිරීමටද අවස්ථාව හිමි වනු ඇත. ශ්‍රී ලංකා ගුවන් හමුදාවේ ගුවන් නියමුවන් සහ ශ්‍රී ලංකා නාවික හමුදාවේ නිරීක්ෂකයන් ඉන්දීය නිලධාරින් සමඟ

පියාසර කරනු ඇත. මෙය ශ්‍රී ලංකා ගුවන් හමුදාව/ශ්‍රී ලංකා නාවික හමුදාව වෙනුවෙන් අර්ධ වාර්ෂිකව සිදු කරන ඩොනියර් පුහුණු ප්‍රහාරක අභ්‍යාසයන් අඛණ්ඩව ඉදිරියට ගෙන යාමකි.

ආරක්ෂක ක්ෂේත්‍රය තුළ ඉන්දියාවේ පළමු ප්‍රමුඛත්වය හිමි වන සහකාර රාජ්‍යය වන්නේ ශ්‍රී ලංකාවයි. ඉන්දියාවේ ජාතික ආරක්ෂක උපදේශක අජිත් දොවාල් මැතිතුමා ඉන්දියාව, ශ්‍රී ලංකාව සහ මාලදිවයින අතර 2020 නොවැම්බර් මස පැවති ත්‍රෛපාර්ශවික සමුද්‍රීය ආරක්ෂක සහයෝගිතා සමුළුවට සහභාගී වීම සඳහා ශ්‍රී ලංකාවට පැමිණි අවස්ථාවේදී ඉන්දියාව ආරක්ෂක ක්ෂේත්‍රය තුළ ශ්‍රී ලංකාවට සම්පූර්ණ සහයෝගය ලබා දෙන බවට ශ්‍රී ලංකා නායකත්වයට සහතික විය. ඉන්දීය ගුවන් හමුදාවේ සහ නාවික හමුදාවේ ගුවන් යානා සහ සාමාජිකයන් ශ්‍රී ලංකා ගුවන් හමුදාවේ 70 වන සංවත්සර සැමරුම් සඳහා සහභාගී වීම දෙරට සහ දෙරටෙහි හමුදාවන් අතර වර්ධනය වන සහයෝගීතාවය සහ සහෝදරත්වය පිළිඹිබු කරයි.

****

කොළඹ
2021 පෙබරවාරි 28